(25)


දුරකථන ) 011 2669192, 011 2675011
தொலைபேசி ) 011 2698507, 011 2694033
Telephone ) 011 2675449, 011 2675280

ෆැක්ස් ) 011 2693866
பெக்ஸ் ) 011 2693869
Fax ) 011 2692913

විද්‍යුත් තැපැල )
மின்னஞ்சல் முகவரி) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) HP/DP/03/2024
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி )
Date ) 05 - 07- 2024

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

*පොදු චක්‍රලේඛ අංක:* 01-28/2024

සියළුම අතිරේක ලේකම්වරුන්
සියළුම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්
සියළුම විශේෂිත වැඩසටහන්වල / සෞඛ්‍ය සේවා ආයතනවල ප්‍රධානීන්
රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති සියළුම රෝහල් ප්‍රධානීන්
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

**පොතුවිල් මූලික රෝහල රේඛීය අමාත්‍යාංශය යටතට පවරා ගැනීම සහ විශේෂ සත්කාර පහසුකම් සහිතව ඒකාබද්ධ සෞඛ්‍ය සේවා මූලික රෝහලක් බවට පරිවර්තනය කිරීම**

පොතුවිල් මූලික රෝහල (ඒ වර්ගය), නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර එය ශ්‍රී ලංකාවේ පැරණිතම රෝහල්වලින් එකකි. ප්‍රදේශයේ සෞඛ්‍ය පහසුකම් සඳහා පවතින වර්තමාන ඉල්ලුම සැලකිල්ලට ගනිමින් සංචාරකයින් සඳහා ගෙවන වාට්ටු පහසුකම්, රෝග නිවාරණ සත්කාර සේවා, වැඩිහිටි සත්කාර සේවා සහ සංචාරක ව්‍යාපාරය සඳහා ආයුර්වේද ප්‍රතිකාර පහසුකම් සහිතව පොතුවිල් මූලික රෝහල සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඒකාබද්ධ සෞඛ්‍ය සේවා සපයන මූලික රෝහලක් බවට පරිවර්තනය කිරීමට යෝජනා කරන ලදී.

02. මෙම සන්දර්භය තුළ, 2024.05.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ 2024.06.24 දිනැති එකඟත්වය පළකරන ලද ලිපිය අනුව, නැගෙනහිර පළාත් සභාව යටතේ පාලනය වූ පොතුවිල් මූලික රෝහල, 2024 අගෝස්තු මස 01වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගනු ලැබේ.

03. තවද, පොතුවිල් මූලික රෝහල රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයට පවරා ගැනීමත් සමඟ රෝහල් කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කර ගැනීම ඔවුන්ගේ එකඟතාවය ඇතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශයන්ට අනුව සිදු කරනු ඇත (ඇමුණුම 1).


385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தைஇ கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

04. මෙම ආයතනය පිළිබඳව අනෙකුත් තොරතුරු පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| 01 | ආයතනයේ නම | මූලික රෝහල - පොතුවිල් (ඒකාබද්ධ සෞඛ්‍ය සේවා පහසුකම් සහිත) |
| 02 | විෂයය පථය | රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 03 | පරිපාලන දිස්ත්‍රික්කය | අම්පාර |
| 04 | ඡන්ද කොට්ඨාශය | දිගාමඩුල්ල |
| 05 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පොතුවිල් |
| 06 | ආසන්නතම පරිපාලන කාර්යාලය | මූලික රෝහල - පොතුවිල් |
| 07 | ආයතනභාර නිළධාරි | වෛද්‍ය අධිකාරී |
| 08 | වාර්තා කළයුතු නිළධාරියා | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් |
| 09 | තැපැල් හා විදුලි ලිපි කාර්යාලය | පොතුවිල් |
| 10 | ආසන්නතම දුම්රිය ස්ථානය | මඩකලපුව |
| 11 | පොලිස් ස්ථානය | පොතුවිල් |

වෛද්‍ය පී. ජී. මහිපාල
**ලේකම්**

වෛද්‍ය පී. ජී. මහීපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත් :

1. ගරු ආණ්ඩුකාර, නැගෙනහිර පළාත
2. ප්‍රධාන ලේකම්, නැගෙනහිර පළාත් සභාව
3. පළාත් සෞඛ්‍ය ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය, නැගෙනහිර පළාත
4. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
5. ප්‍රධාන මූල්‍ය නිළධාරී I/II/III - සෞඛ්‍ය අමාත්‍යාංශය
6. ප්‍රධාන නීති නිළධාරී - සෞඛ්‍ය අමාත්‍යාංශය
7. වෛද්‍ය අධිකාරී - මූලික රෝහල, පොතුවිල්